# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2016.06.14

වේලාව : ප.ව. 02.00

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිළධාරීන්ගේ නාම ලේඛනය :**

1) **ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මිය - ප්‍රධාන ලේකම් ( බ.ප).**
2) **පී. සෝමසිරි මයා. - ආණ්ඩුකාර ලේකම් (බ/ප).**
3) **වී. රාජපක්ෂ මිය - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප).**
4) **එම්.ඒ.බී.ඩී.සෙනරත් මයා - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප).**
5) **එස්.ජී. විජයබන්ඳු මයා - ලේකම්, අධ්‍යාපන, සංස්කෘතික අමාත්‍යාංශය (බ.ප).**
6) **ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය- ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප).**
7) **ප්‍රදීප් රත්නායක මයා - ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ/ප).**
8) **කේ.කේ. චම්පිකා කනේරු මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).**
9) **සිරිසෝම ලොකුවිතාන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු).**
10) **බන්දුල ප්‍රේමකුමාර මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).**
11) **ඩී.එම්.එන්.දිසානායක මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්).**
12) **ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).**
13) **එන්.ආර්.කැකුලන්දල - සහකාර ප්‍රධාන ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප)**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එකම භූමියක ස්ථාපිත කිරීම. | නව පරිශ්‍රයේ ගැටලු සහ අභ්‍යන්තර සකස් කිරීම් පිළිබඳ සොයා බැලීම සඳහා පත් කළ කමිටුව රැස් වූ බවත්, එහි දී පහත සඳහන් ප්‍රධාන ගැටලු හඳුනා ගත් බව නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදි.<br>▪ ඉදි කරමින් පවතින නව පරිශ්‍රයේ වාහන නැවැත්වීම සඳහා බස් නැවතුම් පල භූමිය ලබාගැනීම<br>▪ ගබඩාව සඳහා ඉඩකඩ සීමිත බැවින් ඒ සඳහා නව ඉඩමක් යොදාගැනීම<br>▪ පරිශ්‍රය ඇතුළත Partition මෙන් ම Workstation යොදන ආකාරය<br><br>තවද, සභා පරිශ්‍රය තුල ගෘහභාණ්ඩ, අභ්‍යන්තර අලංකරණ කටයුතු සහ ආලෝකකරණය යන ගැටලු හඳුනා ගත් බව දන්වන ලදි.<br><br>කඩිනමින් කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.<br><br>මේ සඳහා නිරීක්ෂණ චාරිකාව ජූලි මස පළමු සතිය තුල දී යොදාගැනීම සඳහා සාකච්ඡා විය. | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය<br><br>ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ලේකම්, ධීවර හා ප්‍රවාහන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02. | තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම | තාක්ෂණ සේවයේ සිවිල් තනතුර සඳහා ඉදිරිපත් වූ අයදුම්පත් 94න් 54ක් සඳහා කැඳවීම් කළ නමුත්, තනතුරු 48ක් පමණක් පිරවීමට කටයුතු කළ බව නි.ප්‍ර.ලේ.(පි/පු) විසින් දන්වන ලදි.<br><br>මේ අනුව, ඉතිරි පුරප්පාඩු පිරවීමට පුවත්පත් දැන්වීමක් යෙදීම සඳහා කටයුතු කිරීම හා ආණ්ඩුකාරතුමාගේ විශේෂ අවසරයක් ගෙන අයැදුම් කිරීම සඳහා "බස්නාහිර පළාත තුල දැනට ස්ථිර පදිංචිය හිමි" ලෙස වෙනස් කිරීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |
| 03. | තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුර. | ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂ තනතුර අනුමත වී ඇති බැවින්, ඒ සඳහා දීමනාවක් මත පදනම් ව එම කාර්යය සඳහා ම විශේෂිත, සුදුසු පුද්ගලයකු සේවයට බඳවා ගත යුතු බව සාකච්ඡා විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 04. | නව වාහන මිල දී ගැනීම. | ප්‍රධාන ලේකම් කාර්යාල-වාහන මිල දී ගැනීම් කමිටුවේ දී පළාත් සභා ආයතන සඳහා වාහන 67ක් මිල දී ගැනීමට සුදුසු යැයි තීරණය කළ බව ද, අංක 1/2016 දරණ ජාතික අයවැය චක්‍රලේඛයට අනුව නව වාහන මිල දී ගැනීම වෙනුවට වාහන කුලියට ගැනීමට සිදු වන බැවින්, නැවත අත්‍යවශ්‍ය වාහන හඳුනා ගැනීම සිදු කරන ලෙස දැනුම් දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |

| | | | |
|---|---|---|---|
| 05. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය | මාණ්ඩලික නිලධාරීන් සඳහා නිල නිවාස ලබා දීම හෝ ඒ සඳහා දීමනාවක් ලබා දීමට ඇති හැකියාව විමසා බලා වාර්තාවක් සැකසීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය). |
| 06. | ඉදිකිරීම් සම්බන්ධ කටයුතු. | ප්‍රසම්පාදන සැලැස්මෙහි මාර්ගෝපදේශන ක්‍රමවේදය යටතේ ඉදිකිරීම් සැලැස්ම කඩිනමින් සැකසීම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ මන්ත්‍රී වැඩසටහන සම්පාදනය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 07. | ප්‍රගති සමාලෝචනය. | භාණ්ඩාගාරයෙන් මේ වන විට 10%ක ප්‍රතිපාදන ලැබී ඇතත්, වියදම් 1%ක් තරම් වත් නොමැති බැවින් මූල්‍ය ප්‍රගතිය අවම අගයක පවතින බව ප්‍රධාන ලේකම්තුමිය විසින් පෙන්වා දෙන ලදී.<br>එබැවින් එය වර්ධනය කිරීම සඳහා ඉදිරි වැඩකටයුතු සිදු කිරීම.<br>ජූලි මස 5න් පසුව අමාත්‍යාංශ 5හි මූල්‍ය ප්‍රගතිය වාර්තාව ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) |
| 08. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම හා E-recording (SLT Server / Cloud Server) සහ බස්නාහිර පළාත් වෙබ් පිටුව | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමේ ඉදිරි කටයුතු සංවිධානය කිරීම සඳහා පත් කළ කමිටුව මඟින් සකසන ලද අතුරු වාර්තාව, නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරන ලදි.<br><br>කඩිනමින් අවසන් වාර්තාව ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු ) |
| 09. | නිලධාරී දත්ත පද්ධතිය සකස් කිරීම | ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිළධාරී දත්ත පද්ධතිය සැකසීම සඳහා පිරිස් හා පුහුණු අංශය විසින් වැඩසටහනක් නිමවා ඇති බවත්, ඒ සඳහා දත්ත ලබා ගැනීමට ශ්‍රාවස්ති පරිශ්‍රයේ අංශ සඳහා ලිපි ඉදිරිපත් කළ බවත් නි.ප්‍ර.ලේ (පිරිස් හා පුහුණු) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 10. | වාර්ෂික ස්ථාන මාරු වීම සහ අභියාචනා මණ්ඩල ඉදිරිපත් කල ස්ථාන මාරු වීම් මේ දක්වා ක්‍රියාත්මක නො වීම සම්බන්ධව | මේ වන තෙක් මාරු වීම් සඳහා ක්‍රියාත්මක නො වූ නිලධාරීන් පිළිබඳ ලේඛනයක් සකසා ඉදිරිපත් කිරීම.<br><br>ආණ්ඩුකාරතුමා විසින් සහ ප්‍රධාන ලේකම්තුමිය විසින් නිකුත් කළ ලිපි ප්‍රකාර ව කටයුතු කිරීම සම්බන්ධව විගණන පරීක්ෂාවක් සිදු කිරීම<br><br>2017 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දී මෙම තත්ත්වය ඇති නො වීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම හා දත්ත පද්ධතියක අවශ්‍යතාව අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 11. | ධීවර ප්‍රඥප්තිය සකස් කිරීම. | නව ප්‍රඥප්තිය සැකසීම සඳහා ප්‍රඥප්ති කමිටුවට යොමු කිරීම.<br><br>ඉදිරියේ දී සෑම අමාත්‍යාංශයකට ම අදාළ ව පවතින ප්‍රඥප්ති සංශෝධනය හා නවීකරණ කිරීමට කටයුතු කිරීම සහ එහි දී අවස්ථානුකූල ව අමාත්‍යාංශ ලේකම් සම්බන්ධ කර ගැනීම.<br><br>ඒ සඳහා කමිටුවක් පත් කිරීම. | ලේකම්, ධීවර හා ප්‍රවාහන අමාත්‍යාංශය<br><br>ආණ්ඩුකාර ලේකම් (බ.ප) |
| 12. | "ජනපතිට කියන්න" වැඩසටහන | "ජනපතිට කියන්න" වැඩසටහන යටතේ දැනට ප්‍රශ්න 112ක් ලැබී ඇති බවත්, ප්‍රශ්න 33ක් සඳහා පිළිතුරු යොමු කර ඇති බවත්, විසඳීම සඳහා ප්‍රශ්න 77ක් ඇති බවත් නි.ප්‍ර.ලේ.(පාලන) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදි.<br><br>විසඳීම කල් ගත වන ප්‍රශ්න සඳහා අතුරු පිළිතුරු සපයන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් හා සියලු නිලධාරීන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 13. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් නොකිරීම හා සම්බන්ධව | නි.ප්‍ර.ලේ.(පි/පු) විසින් ප්‍රධාන ලේකම් වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදි. පටිපාටි සකස් කර නොමැති ආයතන වල වහා ම පටිපාටි සකස් කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 14. | ණය ශේෂ නිරවුල් කිරීම හා සම්බන්ධ ගැටලුව | ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් රැස්වීමක් කැඳවීම සඳහා දිනයක් යොදාගැනීම. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 15. | සමූහ රක්ෂණ ක්‍රමය | වාර්ෂිකව රක්ෂණ වාරිකය වැඩි හෝ අඩු වුවද, ඒ පිළිබඳ ව නිලධාරීන්ගෙන් කැමැත්ත විමසා ඉදිරියට පවත්වා ගැනීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

<u>නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පළාත් ඵලදායීතා තරගාවලිය | ඵලදායීතාව ප්‍රතිපත්තියක් ලෙස පළාත් සභාව තුල වර්ධනය කිරීමට පියවර ගැනීම.<br><br>විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2016.07.07 දින පැවැත්වීමට නියමිත බව සහ පළාත් තරගාවලියක් 2016 වසර අග දී පැවැත්වීමට සැලසුම් කිරීම.<br><br>2017 වසරේ දී නව පරිශ්‍රය වෙත යාමට අදහස් කරන බැවින්, නව මිල දී ගැනීම් වලින් තොර ව ආයතනය තුල සේවා සැපයීමේ ක්‍රමවේදයේ ඵලදායීතාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කල යුතු බව අවධාරණය කරන ලදි.<br><br>ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 02. | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | භාෂා ප්‍රතිපත්තිය පළාත තුල සහතික කිරීමට කටයුතු කිරීම.<br><br>පළාත් නිල වෙබ් අඩවිය භාෂාත්‍රයෙන් සකස් කිරීම සඳහා 2016.09.14 දින වන විට, භාෂා 3න් තොරතුරු නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) වෙත ලබා දීම සඳහා කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 03. | සංවර්ධන නිලධාරීන් සඳහා 1/30 දීමනාව ලබා ගැනීම සම්බන්ධව හොරණ කලාප කාර්යාලයෙන් යොමු කළ ලිපිය. | සංවර්ධන (ක්ෂේත්‍ර) නිලධාරීන් සඳහා යතුරු පැදිය ද, ලබා දී ඇති බැවින්, 1/30 දීමනාව අනුමත කළ නො හැකි බව ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදි. මේ පිළිබඳ ව 2015.06.30 දින ද, තීරණයක් ගෙන ඇත. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ගේ සීඑම්/ඩබ්පී/සීඑම්ඒ/1/16 අංක දරණ 2016.05.30 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද වාහන රක්ෂණය කිරීම සම්බන්ධ කරුණ. | වෙන් කළ වාහන වලට අමතරව සංචිත වාහන ද, නෛතික රැකවරණය සඳහා රක්ෂණය කළ යුතු බවට ඉදිරිපත් වූ යෝජනාව පිළිබඳ කරුණු විමර්ශනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම.<br><br>ඒ සඳහා දයා සෙනරත්, එස්.ජී.විජයබන්ධු යන ලේකම්වරුන් සහ නි.ප්‍ර.ලේ.(මුල්‍ය)-බන්දුල ප්‍රේමකුමාර යන මහත්වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |

<u>කළමනාකරණ කමිටුවෙන් ඉදිරිපත් වූ යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | විගණන විමසුම් සඳහා පිළිතුරු නො දෙන ආයතන ප්‍රධානීන් ගේ වැටුප් වර්ධක අත්හිටුවීමට කටයුතු කිරීම. | ප්‍රධාන ලේකම්තුමිය විසින් එම කාරණාව සම්බන්ධයෙන් සියලු ම ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කළ අතර, විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු එවීමට නො හැකි නම්, අතුරු වාර්තා හෝ එවීමට කටයුතු කරන මෙන් අවධාරණය කරන ලදි. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් |
| 02. | ප්‍රගති සමාලෝචන රැස්වීම් මාස 02කට වරක් පැවැත්වීම. | අමාත්‍යාංශ හා සංවර්ධන ප්‍රගතිය පිළිබඳ ව විශේෂ අවධානය යොමු කිරීම මඟින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය අයත් කර ගැනීම සඳහා කටයුතු කිරීම.<br><br>2017 සැලැස්ම සඳහා පූර්ව සූදානමින් කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් |

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**